# නබි (ﷺ) තුමාණන්ගේ සිරිත් විරිත් වල අගය

**එම්. වසීම්** (6 වසර)

ලොවට පහළ වූ නබිවරුන්ගෙන් (දේව දූතයන්ගෙන්) අන්තිම දේව දූතයා වූ නබි (ﷺ) තුමාණන් මින් අවුරුදු 1426කට පෙර අපට කියාදුන් සිරිත් විරිත් බොහමයක් අද අභාවයට යමින් පපවතී. ඔහුගේ හොඳ චාරිත්‍ර, චාරිත්‍රවල අගය නොදැන ඒ වෙනුවට අද මුස්ලිම් සමාජයේ බෙහෙවින් බලපත් වනුයේ බටහිර සිරිත් විරිත්ය එහෙති ගුණ ගරුක, විනීත සමාජයක් බිහිවීම සඳහා අපේ නබි තුමා කියාදුන් සිරිත් විරිත් වලින් ලැබෙන පිටිවහල ඉතා මහත්ය. ඒ සම්බන්ධව අල්ලාහ් නබිතුමාට අල් - කුර්ආනය මගින් මෙසේ පවසයි **සත්‍යවශයෙන්ම ඔබ තුළ හොඳ ගතිගුණ දක්නට ඇත.** (අල්-කුර්ආන් 68 : 4) නබි (ﷺ) තුමා පවා අබුහුරෙරා (රලි) තමාට උපදෙස් දෙනවිට මෙසේ පැවසුවේය. "අබුහුරෙරා ඔබ හොඳ ගති ගුණ සහිත පුද්ගලයක් වීම ඉතා අවශ්‍යයි" එවිට අබුහුරෙරා (රලි) තුමා ඒගෙන තව තවත් දැනගැනීමට හොඳ සිරිත් විරිත් යනු කුමක් ද යන්න විමසූ විට නබි (ﷺ) තුමාණන් මෙසේ පිළිතුරු දුන්නේ ය "ඔබව සමාජයෙන් ඈත් කර නරක අන්දමින් හැසිරෙන අය සමඟ ඔබ ලංවී හොඳින් හැසිරෙන්න තවත් ඔබට අපරාද, හිරිහැර කරන අයට ඔබ සමාව දෙන්න යමක් ඔබට නොදෙන අයට ඔබ දෙන්න" (මූලාශ්‍ර ග්‍රන්ථය : බයිහකී)

එපමණක් නොව, වැඩිහිටියන්ට ගුරු දෙගුරුන්ට, ගරු කිරීමේ සිරිත අද මුස්ලිම් සමාජයේ අඩු වී ඇත. බොහෝ අත්දැකීම හා දැනුම ඇති වැඩිහිටියන් කෙරෙහි බාල පරපුර ගරු නොකරන තත්වයක් අද උදා වී තිබෙන බැවින් බාල පරපුරට අවශ්‍ය වන නිසි මග පෙන්වීම නොලැබේ. එක් පරපුරක අය මෙලෙස අසංවර වනවිට ඉන්පසුව බිහිවන පරපුර වඩාත් අසංවර වේ. මෙසේ නබි (ﷺ) තුමාණන් කියාදුන් හොඳ ගතිගුණ හා උතුම් චාරිත්‍ර නිසි ආකාරයට නොපිළිපැදීම නිසා අද නූතන ලෝකයේ මුස්ලිම් සමාජයට විශාල ප්‍රශ්ණ වලට මුහුදීමට සිදු වී ඇති අතර ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ ලොකු පරාජයක් හා පසු නැවීමක් ද උදා වී ඇත.

නබි (ﷺ) තුමාණන් හොඳ ගතිගුණ සම්බන්ධව තවත් පැහැදිලි කරන විට මෙසේ පවසය. **අල්ලාහ්ව සම්පූර්ණයෙන්ම විශ්වාස කරන මිනිසා නම් හොඳ ගතිගුණ ඇති පුද්ගලයාය** (මූලාශ්‍ර ග්‍රන්ථ : අබූදාවූද්, අහ්මද්, තිර්මිදී)

මෙම නූතන ලෝකයේ කුඩා ළමුන් ඇතුළු වයසට පැමිණි වැඩිහිටියන් පවා මිනිස් ඝාතනය, සොරකම, මත්පැන් පානය, මංකොල්ල කෑම වැනි ඉස්ලාම් ආගම ඉඳුරා තහනම් කර ඇති නරක ක්‍රියාවල නිසැලී සිටිති.

මිනිසුන්ට අධික වශයෙන් ස්වර්ගයට යවන්නේ අල්ලාහ්ව බියෙන් ජීවත් වීම හා හොඳ ගතිගුණ යැයි නබි තුමා අපට උගන්වා දී ඇත (මූලාශ්‍ර ග්‍රන්ථ : අහ්මද්, තිරුමිදී, ඉබ්නු මාජා)

නබි (ﷺ) තුමාණන්ගේ උතුම් චාරිත්‍ර, චාරිත්‍ර හා අපට කියාදුන් දොද සිරිත්, විරිත් වල අගය කියා නිම කළ නොහැක. හොඳ මනසක් ඇති කවුරුත් ඒ ගැන සිතා හොඳින් පිළිපැදීම ඉතා අවශයකි. එපමණක් නොව ඔහුගේ සිරිත් අනුව සංවර බව ද ඉතා වටිනා ගුණයකි. කථා බහ, කෑම බීම, ගමන, ඇඳුම් පැලඳුම් යන සියල්ලම ගැන නබි තුමා අපට පැහැදිලි කළේ සංවර ලෙසය.

එනම් නබි (ﷺ) තුමාණන්ගේ ගතිගුණ සියල්ල හොඳින් ප්‍රගුණකර පිළිපැද, මුළු සමාජයෙන්ම අසංවරකම හා අවිනීතකම නිරන්තරයෙන් දුරුකර, ලස්සන අනාගතයක් කරා පිය නැගීමටත්, ජන්නතුල් ෆිර්දව්ස් නැමැති උසස්ම ස්වර්ගය ලබා ගැනීමටත් අල්ලාහ් අපට උදව් කරන්වා. ආමීන්.